කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ

පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

## ගණිතය - I

11 ශ්‍රේණිය                                                                 කාලය පැය 02 යි

- A කොටසේ 1 - 10 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු 01 බැගින් ද 11-30 දක්වා ප්‍රශ්න සඳහා ලකුණු 02 බැගින් ද හිමිවේ.
- B කොටසේ එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමිවේ.
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01) පොතක මිල රු. 15 කි. එවැනි පොත් X ප්‍රමාණයක මිල සොයන්න.

02) පාදයක දිග 5.5 cm වූ සමපාද ත්‍රිකෝණයක පරිමිතිය සොයන්න.

03) පැයට කිලෝමීටර 25 ක ඒකාකාර වේගයෙන් ගමන් කරන වාහනයක් පැය 3 ක දී ගමන් කරන දුර සොයන්න.

04) $5x \leq 20$ නම්, x සඳහා ගත හැකි උපරිම අගය සොයන්න.

05) $2^{-3}$ හි අගය සොයන්න.

06) A සිට B හි දිගංශය කීයද ?




07) ලීටර 5.4, මිලි ලීටර වලින් ලියන්න.

08) "BALL" යන වචනයේ අකුරු කුලකය ලියන්න.

09) $\frac{55}{\square} = -5$ නම් කොටුව තුල තිබිය යුතු සංඛ්‍යාව සොයන්න.

10) $6\sqrt{2} - 4\sqrt{2}$ හි අගය සොයන්න.

11) $\log_5 125 - \log_3 3 + 2$ හි අගය සොයන්න.

12) 102 X 98 සාධක දැනුම භාවිතයෙන් අගය සොයන්න.

13) $3^x \times 9^4 = 3^5$ නම් x හි අගය සොයන්න.

14) AB සරල රේඛාවේ

i. අන්තඃඛණ්ඩය සොයන්න.

ii. රේඛාවේ අනුක්‍රමණය සොයන්න.




15) දී ඇති රූපයේ $A\hat{B}D$ සමච්ඡේදකය BC වේ. X හි අගය සොයන්න.




16) lg 3 = 0.4771 නම් lg30 හි අගය සොයන්න.

17) කේතුවක් සැකසීමට භාවිතා කළ පතොරමක් රූපයේ දැක්වේ. එමගින් සකස්වන කේතුවේ,

i. ඇල උස

ii. පතුලේ අරය සොයන්න.




18) භාණ්ඩයක් විකිණීමේ දී එහි ලකුණු කල මිලෙන් 6% ක වට්ටමක් දෙනු ලැබේ. විකුණු මිල රු 658 ක් වන භාණ්ඩයක ලකුණු කල මිල සොයන්න.

19) X හි අගය සොයන්න.




20) අඳුරු කළ කොටසේ පරිමිතිය සොයන්න.



21) 1 : 50 000 ඇඳ තිබෙන සිතියමක නගර 2 ක් අතර දුර 15cm නම් නගර දෙක අතර සැබෑ දුර කිලෝ මීටර් කොපමණද ?

22) $\frac{a}{b}+\frac{b}{a}=5$ නම් $\frac{a^2}{b^2}+\frac{b^2}{a^2}$ හි අගය සොයන්න.

23) $\frac{10}{\sqrt{2}}$ හි හරය පරිමේය කරන්න.

24) ටැංකියකින් $\frac{3}{5}$ ජලයෙන් පිරවීමට මිනිත්තු 15 ගතවේ නම් ටැංකියෙන් අඩක් පිරීමට කොපමණ කාලයක් ගතවේද ?

25) රූපයේ දක්වා ඇති ABC සහ DEF යනු සමපාද ත්‍රිකෝණ 2 කි. අඳුරු කළ කොටස මුළු රූපයෙන් කිනම් භාගයක්ද?




26) $\frac{a^{-2}\times a^{8}}{a^{3}}=8$ නම් a හි අගය සොයන්න.

27) $\frac{3(a+1)}{a^2-1}$ යන භාගයට සරලම තුල්‍ය භාගය සොයන්න.

28) ABC ත්‍රිකෝණයේ වර්ගඵලය සොයන්න.




29) ඝනකාභයක දිග, පළල සහ උස අතර අනුපාතය 4 : 3 : 2 කි. එහි පෘෂ්ඨ වර්ගඵලය $468cm^2$ වේ. ඝනකාභයේ උස සොයන්න.

30) $\sqrt{5^a \times 2^b}=20$ නම් a හා b මගින් දැක්වෙන සංඛ්‍යා දෙක ලියන්න.

The National e-learning Portal for The General Education

## B – කොටස

01) a) $(4\frac{1}{2} - \ldots.) \times 1\frac{3}{13} = 4\frac{4}{5}$ වීමට හිස්තැනට ගැලපෙන භාගය සොයන්න. (ලකුණු 03)

b) වෙළෙන්දෙක් මිලදී ගත් ඇපල් වලින් $\frac{1}{2}$ රු 50 බැගින් ද $\frac{1}{5}$ ක් රු 40 බැගින් ද ඉතිරිය රු 30 බැගින් ද විකිණීමට අදහස් කරන ලදී.

i. රු 30 බැගින් විකිණීමට ඉතිරි වූයේ මිලදී ගත් ඇපල් වලින් කිනම් භාගයක් ද ? (ලකුණු 02)

ii. රු 30 බැගින් විකුණු ඇපල් වලින් ලද ආදායම රු. 1800 ක් නම්, මිලට ගත් ඇපල් ගෙඩි ගණන කීයද ? (ලකුණු 02)

iii. ඇපල් විකිණීමෙන් ලැබූ මුළු ආදායම කොපමණද ? (ලකුණු 01)

iv. ඉහත ආකාරයට ඇපල් වර්ග නොකර තොගයම එකක් රු 40 බැගින් විකුණුමේ නම් තමන්ට රු. 400 ක පාඩුවක් සිදුවන බව වෙළෙන්දා පැවසුවේය. ඔහුගේ ප්‍රකාශනය සත්‍ය ද අසත්‍ය ඇයි හේතු සහිතව පහදන්න.

(ලකුණු 02)

02)




රූපයේ දැක්වෙන්නේ නිවසක තාප්පයක ඉදිරිපස පෙනුමය. එය සෘජුකෝණාස්‍ර කොටසකින් සහ ගේට්ටුවකින් සමන්විතය. ගේට්ටුවේ ඉහළ කොටස අර්ධ වෘත්තාකාර වේ.

i. අර්ධ වෘත්තාකාර කොටසේ අරය සොයන්න. (ලකුණු 01)

ii. අර්ධ වෘත්ත චාපයේ දිග සොයන්න. (ලකුණු 02)

iii. දොරටුව හැර ඉතිරි කොටසේ වර්ගඵලය සොයන්න. (ලකුණු 03)

The National e-learning Portal for The General Education

iv. දොරටුව හැර ඉතිරි කොටසේ පරිමිතිය සොයන්න. (ලකුණු 02)

v. තාප්පයේ තීන්ත ආලේප කිරීමට $1m^2$ සඳහා රු. 105 වැය වේ නම් ඒ සඳහා වැය වන මුදල සොයන්න. (ලකුණු 02)

03) a) ලී බඩු වෙළෙන්දෙක් රු. 20 000 ට මිලදී ගත් පුටුකට්ටලයක් 25% ක ලාභයක් ලැබෙන සේ මිල ලකුණු කර 5% ක වට්ටමක් සහිතව විකුණයි.

i. පුටු කට්ටලයේ ලකුණු කළ මිල සොයන්න. (ලකුණු 02)

ii. පුටු කට්ටලයේ විකුණුම් මිල සොයන්න. (ලකුණු 02)

iii. පුටු කට්ටලය විකිණීමෙන් ලැබෙන ලාභ ප්‍රතිශතය සොයන්න. (ලකුණු 02)

e තක්සලාව The National e-learning Portal for The General Education

b) මුදලක් A, B හා C අතර බෙදනු ලබන්නේ A : B = 2 : 3 ද A : C = 5 : 1 ද වන පරිදිය.

i. A : B : C සොයන්න. (ලකුණු 02)

ii. C ට ලැබුණු මුදල රු. 520 ක් නම් බෙදන ලද මුළු මුදල සොයන්න. (ලකුණු 02)

04) පාසලක සිසුන් පිරිසකගෙන් තමන් කැමති රූපවාහිනී වැඩසටහන විමසන ලදුව ඒ පිළිබඳව ලබාගත් තොරතුරු පහත වට ප්‍රස්තාරයේ දක්වා ඇත. :




එහි දැක්වෙන තොරතුරු අනුව,

i. අඩුම පිරිසක් කැමති කුමන වැඩසටහනට ද ? (ලකුණු 02)

ii. කාලීන වැඩසටහන් වලට කැමති සිසුන් ගනන 15 නම් කණ්ඩායමේ මුළු සිසුන් ගණන සොයන්න. (ලකුණු 02)

e තක්සලාව
The National e-learning Portal for The General Education

iii. ටෙලි නාට්‍ය නැරඹීම කැමති සිසුන් ගණන සොයන්න. (ලකුණු 03)

iv. ටෙලිනාට්‍ය නරඹන සිසුන්ගෙන් 15 ක් ප්‍රවෘත්ති නැරඹීමට තීරණය කරන ලදී. එවිට ප්‍රවෘත්ති නිරූපණය කළ යුතු කෝණය සොයන්න. (ලකුණු 03)

05)



අ.පො.ස. (සා/පෙළ) විභාගයට පෙනී සිටි අපේක්ෂකයින් 120 කගෙන් ලබාගත් තොරතුරු මෙසේය.

- විද්‍යාව සමත් සියලුම දෙනා ගණිතය ද සමත් වන අතර විද්‍යාව සමත් ශිෂ්‍ය සංඛ්‍යාව 40 කි.
- ගණිතය විෂයය පමණක් සමත් සහ විෂයයන් දෙකම අසමත් ශිෂ්‍යයින් අතර අනුපාතය 2 : 3 කි.

i. ඉහත තොරතුරු වෙන් රූපසටහනට ඇතුල් කරන්න. (ලකුණු 01)

ii. විෂයයන් 2 ම අසමත් සංඛ්‍යාව සොයන්න. (ලකුණු 03)

iii. ගණිතය සමත් සංඛ්‍යාව කොපමණද ? (ලකුණු 03)

iv. අහඹු ලෙස තෝරා ගන්නා ශිෂ්‍යයෙක් ගණිතය පමණක් සමත් අයෙකු වීමේ සම්භාවිතාව සොයන්න. (ලකුණු 03)

කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ

පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

## ගණිතය - II

11 ශ්‍රේණිය | කාලය පැය 02 මි.30 යි

- A කොටසේ ප්‍රශ්න 05 ක් සහ B කොටසින් ප්‍රශ්න 05 ක් තෝරාගෙන ප්‍රශ්න 10 කට පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමිවේ.

(අරය r වූ කේතුවක වක්‍ර පෘෂ්ඨ වර්ගඵලය $\pi rl$ ද පරිමාව $\frac{1}{3}\pi r^2 h$ ද වේ.)

( අරය r වූ ගෝලයක පෘෂ්ඨ වර්ගඵලය $4\pi r^2$ ද පරිමාව $\frac{4}{3}\pi r^3$ ද වේ.

## A - කොටස

01)

> 'LIEON' වර්ගයේ මෝටර් රථ ආනයනය සඳහා අයකළ 30% ක් වූ තීරුබදු ප්‍රතිශතය 60% දක්වා වැඩිකෙරේ.
>
> ප්‍රවෘත්තියක්

i. 'LIEON' වර්ගයේ මෝටර් රථයක ආනයන මිල ඇමරිකන් ඩොලර් 45000 කි. ඇමරිකන් ඩොලර් 1 ක් ශ්‍රී ලංකා රුපියල් 120 ක් නම් එය ආනයනය කිරීමට වැයවනමුදල ශ්‍රී ලංකා රුපියල් වලින් සොයන්න. (ලකුණු 02)

ii. තීරුබදු වැඩිවීමට පෙර තීරු බදු සමඟ රථයේ වටිනාකම සොයන්න. (ලකුණු 02)

iii. බදු වැඩිවීමෙන් පසු රථයේ වටිනාකම සොයන්න. (ලකුණු 03)

iv. බදු වැඩිවීමෙන් පසු ඩොලරයක මිල ද 25% කින් ඉහළ ගියහොත් ආනයනය සඳහා වැයවන මුදල ශ්‍රී ලංකා රුපියල් වලින් සොයන්න. (ලකුණු 03)

02)

අ) දර්ශක නීති ඇසුරෙන් අගය සොයන්න.

$$\left(\frac{27}{125}\right)^{-\frac{2}{3}} \text{ X } \sqrt{\frac{72}{50}} \text{ X } 3^0$$ (ලකුණු 02)

ආ) ලඝුගණක වගු භාවිතා නොකොට අගය සොයන්න.

$X - 2\lg 2 = \lg 75 - \lg 3$ (ලකුණු 02)

ඉ) ලඝුගණක වගු භාවිතා කොට $\dfrac{38.65 \text{ X } (0.0474)^{\frac{1}{3}}}{(2.076)^2}$ හි අගය දෙවන දශමස්ථානයට නිවැරදිව දක්වන්න.

(ලකුණු 06)

32

03) අ) $y = 2x^2 + 1$ ශ්‍රිතයේ ප්‍රස්තාරය ඇඳීම සඳහා සකස් කළ x හා y හි අගය ඇතුළත් අසම්පූර්ණ වගුවක් පහත දැක්වේ.

| X | -3 | -2 | -1 | 0 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|
| Y | 19 | ......... | 3 | .......... | 3 | 9 | 19 |

i. x = -2 වන විට සහ x = 0 වන විට y හි අගයන් සොයන්න. (ලකුණු 02)

ii. x අක්ෂය දිගේ කුඩා බෙදුම් 10 කින් ඒකක එකක් ද y අක්ෂය දිගේ කුඩා බෙදුම් 10 කින් ඒකක 2 ක් ද නිරූපණය වන සේ පරිමාණය යොදා ගනිමින් ඉහත ශ්‍රිතයේ ප්‍රස්තාරය ප්‍රස්තාර කඩදාසියක අඳින්න. (ලකුණු 02)

ආ) ප්‍රස්තාරය භාවිතයෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. ශ්‍රිතයේ අවම අගය කීයද ? (ලකුණු 01)

ii. ශීර්ෂයේ ඛණ්ඩාංක ලියන්න. (ලකුණු 01)

iii. $y \leq 4$ වන x හි අගය පරාසය ලියන්න. (ලකුණු 02)

iv. ශ්‍රිතය y අක්ෂය ඔස්සේ ඒකක 3 කින් ඉහළට විස්ථාපනය කළ විට ලැබෙන ප්‍රස්තාරයට අදාළ ශ්‍රිතයේ සමීකරණය ලියන්න. (ලකුණු 02)

04)



අරය 2a සහ උස එමෙන් තුන්ගුණයක් වූ ඝන ලෝහ කේතුවක් උණුකර අරය a/2 වූ ලෝහ ගෝල තනනු ලැබේ.

i. කේතුවේ පරිමාව සහ ඇසුරින් දක්වන්න. (ලකුණු 03)

ii. ගෝලයක පරිමාව සඳහා ප්‍රකාශයක් ලියන්න (ලකුණු 02)

iii. සෑදිය හැකි ගෝල ගණන කොපමණද ? (ලකුණු 02)

iv. කේතුවේ අරය 2cm ද කේතුව සාදා ඇති ලෝහ වර්ගයේ ඝන සෙන්ටිමීටරයක ($1cm^3$) ක බර 10g නම් සාදාගත් ගෝල සියල්ලේ ම බර සොයන්න. (ලකුණු 03)

(සැ.යු. - කේතුව උණු කර ගෝල තැනීමේ දී ලෝහ අපතේ නොයන්නේ යයි සලකන්න.)

05) a) සුරංග තම ව්‍යාපාරික ස්ථානය සඳහා වරිපනම් බදු ලෙස කාර්තුවකට රු 1200 බැගින් ගෙවයි. ගොඩනැගිල්ල සඳහා අයකරන වාර්ෂික වරිපනම් බද්ද එහි වාර්ෂික වටිනාකමින් 12% ක් වේ.

i. සුරංග වසරක් සඳහා ගෙවන වරිපනම් බදු මුදල සොයන්න. (ලකුණු 01)

ii. ගොඩනැගිල්ලේ වාර්ෂික වටිනාකම සොයන්න. (ලකුණු 02)

ඔහු තම ව්‍යාපාරික ස්ථානය මසකට රු 25000 බැගින් කුලියට දීමට අදහස් කරන ලදී.

iii. කුලියට දීමෙන් ඔහු වර්ෂයකදී ලබන ආදායම සොයන්න. (ලකුණු 01)

iv. වසර අවසානයේ ඔහු අත ඉතිරිවන මුදල කොපමණද ? (ලකුණු 02)

b) වෙළෙන්දෙක් භාණ්ඩයක් මිලට ගෙන 25% ලාභ ලැබෙන සේ එහි මිල ලකුණු කරයි. එය අත්පිට මුදලට විකිණීමේදී ලකුණු කළ මිලෙන් 6% ක වට්ටමක් ලබාදෙයි. ඔහු එය අත්පිට මුදලට රු. 1034 ට විකුණන්නේ නම්

i. වෙළෙන්දා ලකුණු කළ මිල සොයන්න. (ලකුණු 02)

ii. වෙළෙන්දා එය ගත් මිල සොයන්න. (ලකුණු 02)

06) a)

i. සාධක සොයන්න.

4P − 6PQ + Pq − 6 (ලකුණු 03)

ii. $9.9^2$ හි අගය ද්විපද ප්‍රකාශනයක වර්ගායිතයක් ලෙස ලියා සොයන්න. (ලකුණු 03)

b) රථවාහන නැවතුම් පලක නවතා ඇති වාහන පිළිබඳව දිලුම් තම මිතුරාට පැවසූ තොරතුරු මෙසේය. වාහන 15 ක් නවතා තිබේ. වාහන වර්ග 2 කි. එනම් මෝටර් සයිකල් සහ මෝටර් රථය. වාහන සියල්ලේම රෝද ගණන 64 කි. නවතා ඇති මෝටර් සයිකල් ගණන x ද මෝටර් රථ ගණන y ද ලෙස ගෙන

i. සමගාමී සමීකරණ යුගලයක් ගොඩ නගන්න. (ලකුණු 02)

ii. එය විසඳීමෙන් මෝටර් සයිකල් ගණනත්, මෝටර් රථ ගණනත් වෙන වෙනම සොයන්න. (ලකුණු 02)

07) සරල දාරයක් කවකටුවක් හා cm/mm පරිමාණයක් පමණක් භාවිත කර නිර්මාණ රේඛා පැහැදිලිව දක්වමින්, PQ = 7.2cm , QR = 5.4 cm , $P\hat{Q}R = 75^0$ , QS = 8.3cm සහ RS = PS වන PQRS චතුරස්‍රය පහත පියවර අනුගමනය කරමින් නිර්මාණය කරන්න.

i. නිර්මාණය ඇරඹීමට පෙර දළ රූපසටහනක් ඇඳ දත්ත ලකුණු කරන්න. (ලකුණු 01)

ii. චතුරස්‍රය නිර්මාණය කරන්න. (ලකුණු 04)

iii. RS හි දිග මැන ලියා දක්වන්න. (ලකුණු 01)

iv. QS හා QR හි ලම්බ සමච්ඡේදක නිර්මාණය කර ඒවායේ ඡේදන ලක්ෂ්‍යය T ලෙස නම් කරන්න. (ලකුණු 02)

v. TQ අරය ලෙස ගෙන S , R සහ Q ලක්ෂ්‍ය හරහා ගමන් කරන වෘත්තය නිර්මාණය කරන්න. (ලකුණු 02)

08) සේවකයන් 50 දෙනෙකු සේවය කරන සෙල්ලම් බෝනික්කන් අපනයනය කරන කර්මාන්ත ශාලාවක බෝනික්කෙකු සකස් කර නිම කිරීමට සේවකයෙකුට ගතවන කාලය සෙවීමට කරන ලද සමීක්ෂණයකින් පහත සඳහන් තොරතුරු රැස් කරගන්නා ලදී.

| ගතවන කාලය (මිනිත්තු) | 21-25 | 26-30 | 31-35 | 36-40 | 41-45 | 46-50 | 51-55 | 56-60 |
|---|---|---|---|---|---|---|---|---|
| සේවක සංඛ්‍යාව | 2 | 5 | 7 | 10 | 14 | 8 | 3 | 1 |

i. වැඩිම සේවක සංඛ්‍යාවක් බෝනික්කෙකු සකස් කිරීමට වැය කළ කාල ප්‍රාන්තරය ලියන්න.(ලකුණු 01)

ii. සේවකයෙකුට බෝනික්කෙකු සකස් කිරීමට ගතවන මධ්‍යන්‍යය කාලය සොයන්න. (ලකුණු 04)

iii. හදිසි ඇනවුමක් සඳහා පැය 8 ක සේවා මුරයකදී බෝනික්කන් 900 ක් නිම කිරීමට සිදුවී ඇත. ඒ සඳහා යෙදවිය යුතුයැයි අපේක්ෂා කරන සේවකයින් සංඛ්‍යාව කොපමණද ? (ලකුණු 03)

iv. සේවකයෙකු දිනකට පැය 6 කට වඩා වැඩ කරන්නේ නම් වැඩිවන සෑම පැයකටම රු. 70 ක අතිකාල දීමනාවක් ගෙවනු ලැබේ. මේ අනුව ඉහත ඇනවුම නිසා ආයතනයට සේවකයන් සඳහා ගෙවීමට සිදුවූ අතිරේක මුදල සොයන්න. (ලකුණු 02)

09) 


රූපයෙහි දැක්වෙන ABCD සමාන්තරාස්‍රයකි. AC විකර්ණයට සමාන්තරව B හරහා ඇඳි රේඛාවට දික්කල DC රේඛාව E හිදී හමුවේ. AC ට ලම්බකව DG ද BE ට ලම්බකව CF ද ඇඳ තිබේ.

i. ABCD සමාන්තරාස්‍රයට වර්ගඵලයෙන් සමාන සමාන්තරාස්‍රයක් නම් කරන්න. (ලකුණු 01)

ii. DC = CE බව පෙන්වන්න. (ලකුණු 02)

iii. DGC$\Delta \equiv$ CFE$\Delta$ බව සාධනය කරන්න. (ලකුණු 03)

iv. DG // CF බව පෙන්වන්න. (ලකුණු 02)

v. DGFC සමාන්තරාස්‍රයක් බව පෙන්වන්න. (ලකුණු 02)

10) 


ඉහත වෘත්තයේ කේන්ද්‍රය 0 වන අතර OP අරය සහ QR ජ්‍යාය සමාන්තර වේ.
OR සහ QP , S හි දී ඡේදනය වේ.

i. $R\hat{O}P$ සහ $R\hat{Q}P$ අතර සම්බන්ධතාවයක් ලියන්න. ඒ සඳහා පදනම් වන ජ්‍යාමිතික ප්‍රමේයය ලියන්න. (ලකුණු 02)

ii. $R\hat{Q}P$ ට සමාන කෝණයක් නම් කරන්න. (ලකුණු 02)

iii. $R\hat{S}P = 3\ S\hat{P}O$ බව සාධනය කරන්න. (ලකුණු 03)

iv. දික්කල RO වෘත්තය. T හිදී හමුවේ නම් $T\hat{Q}R$ හි අගය සොයන්න. හේතු දක්වන්න. (ලකුණු 03)

11) සමාන්තර ශ්‍රේඪියක මුල් පද n හි ඓක්‍යය $S_n = 7n - 2n^2$ මගින් දෙනු ලැබේ.
(ලකුණු 01)

i. පළමු පදය සොයන්න. (ලකුණු 02)

ii. මුල් පද දෙකෙහි ඓක්‍යය කුමක්ද ? (ලකුණු 02)

iii. මෙම සමාන්තර ශ්‍රේඪියේ පොදු අන්තරය සොයන්න. (ලකුණු 02)

iv. ඓක්‍යය ලෙස -30 ලැබෙනුයේ පළමු පදයේ සිට පද කීයක් එකතු කළ විටද? (ලකුණු 03)

12) a) i. $\frac{5}{y-3} + \frac{2}{3-y}$ සුළු කරන්න. (ලකුණු 02)

ii. $\frac{1}{m+3} + \frac{2m}{m^2-9}$ (ලකුණු 02)

b) සුනිල් සහ නිමල් එකම කාර්යාලයක සේවයේ නියුතු සේවකයන් දෙදෙනෙකි සුනිල් බදාදා දිනයක නිවාඩුවක් ලබා ගැනීමේ සම්භාවිතාව 1/4 වන අතර නිමල් බදාදා දිනයක නිවාඩුවක් ලබා ගැනීමේ සම්භාවිතාව 1/5 කි.

i. ඉහත දී ඇති තොරතුරු රුක් සටහනක දක්වන්න. (ලකුණු 03)

ii. රුක් සටහන ඇසුරෙන් ඔවුන් දෙදෙනාගෙන් එක් අයකුවත් බදාදා දිනයකදී නිවාඩුවක් ලබා ගැනීමේ සම්භාවිතාව සොයන්න. (ලකුණු 03)